**ශ්‍රී ලංකාවට පැමිණි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිලධාරී කණ්ඩායම සිය සංචාරය අවසන් කරයි**

2025 අප්‍රේල් 11

යම් රටක සංචාරයකින් පසු හඳුනා ගන්නා ලද මූලික සොයාගැනීම් පිළිබඳව ජා.මූ. අරමුදලේ කාර්යමණ්ඩල කණ්ඩායම්වල ප්‍රකාශ එම දූත මෙහෙය අවසානයේ නිකුත් කරන මාධ්‍ය නිවේදනයන්හි ඇතුළත් වේ. මෙම ප්‍රකාශයේ අන්තර්ගත අදහස් ජා.මූ. අරමුදලේ කාර්යමණ්ඩලයේ වන අතර එමගින් ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ අදහස් අවශ්‍යයෙන් ම නියෝජනය නොවේ.

- *ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ සිව්වන සමාලෝචනයට පාදක වන ආර්ථික ක්‍රියාකාරිත්වය සහ ප්‍රතිපත්ති පිළිබඳව ජා.මූ. අරමුදලේ කාර්යමණ්ඩල කණ්ඩායම ශ්‍රී ලංකා බලධාරීන් සමඟ ඉතා ඵලදායී සාකච්ඡා පැවැත්වීය.*
- *ගෝලීය අවිනිශ්චිතතාව තවමත් ඉහළ මට්ටමක පවතින අතර එය මූල්‍ය වෙළඳපොළ අස්ථාවරත්වයට දායක වේ. රජය වැඩසටහනේ අරමුණු සඳහා කැපවී සිටින අතර, ඒවා ක්‍රියාත්මක කිරීම ශක්තිමත් සහ ප්‍රශංසනීය වන නමුත් බාහිර කම්පනයෙන් ශ්‍රී ලංකාවට ඇති වන බලපෑම තක්සේරු කිරීමට තවත් කාලයක් අවශ්‍ය වේ.*
- *ගෝලීය අවිනිශ්චිතතාවය ඉහළ මට්ටමක පවතින මෙම කාලපරිච්ඡේදය තුළ, වැඩසටහන යටතේ ප්‍රතිසංස්කරණ ගම්‍යතාවය පවත්වා ගෙන යන පරාමිතීන් සහ ප්‍රතිපත්ති පිළිබඳව නුදුරු කාලයේ දී එකඟතාවයකට පැමිණීම සඳහා සාකච්ඡා දිගටම කරගෙන යනු ඇත.*

**කොළඹ, ශ්‍රී ලංකාව**: එවන් පපාජෝ(ර්)ජියෝ මහතාගේ නායකත්වයෙන් යුත් ජා.මූ. අරමුදලේ දූත කණ්ඩායමක් 2025 අප්‍රේල් 03 සිට 11 දක්වා කොළඹ සංචාරයක යෙදුණි. කොළඹ පැවති සාධනීය සාකච්ඡාවලින් අනතුරුව එවන් පපාජෝ(ර්)ජියෝ මහතා විසින් පහත ප්‍රකාශය නිකුත් කරන ලදී:

"ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම මගින් සහාය දක්වන, ශ්‍රී ලංකාවේ ඉහළ අපේක්ෂා සහිත ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය අඛණ්ඩව ප්‍රශංසනීය ප්‍රතිඵල ලබා දෙමින් පවතියි. අර්බුදකාරී කාල පරිච්ඡේදයෙන් අනතුරුව, 2024 වසරේ දී ආර්ථික වර්ධනය සියයට 5ක් දක්වා ළඟා වීම සතුටුදායක වේ. උද්ධමනය මෑත කාර්තුවල දී සැලකිය යුතු ලෙස අඩු වූ අතර 2025 වසරේ මාර්තු අග වන විට සියයට -2.6ක් දක්වා පහත වැටුණි. මහ බැංකුව විසින් සිදු කළ සැලකිය යුතු විදේශ විනිමය මිල දී ගැනීම් සමඟ 2025 වසරේ මාර්තු මස අග වන විට දළ නිල සංචිත එ.ජ. ඩොලර් බිලියන 6.5ක් දක්වා ඉහළ ගියේය. සැලකිය යුතු රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ මගින් රාජ්‍ය මූල්‍ය ශක්තිමත් වී තිබේ.

"මෑත කාලීනව මතු වී ඇති විදේශීය කම්පනය සහ පවතින වර්ධනයන්, තවමත් ආර්ථික අර්බුදයෙන් යථා තත්ත්වයට පත්වෙමින් සිටින ශ්‍රී ලංකා ආර්ථිකයට අවිනිශ්චිතතාවයක් ඇති කරමින් පවතී. ගෝලීය කම්පනයේ බලපෑම සහ ජා.මූ. අරමුදලේ සහාය ලබන වැඩසටහනේ පරාමිතීන් තුළ ශ්‍රී ලංකාවට එහි බලපෑම අවම කරගත හැකි ආකාරය තක්සේරු කිරීමට තවත් කාලයක් අවශ්‍ය වේ.

" වැඩසටහනේ අරමුණු සඳහා රජයේ නිරන්තර කැපවීම මගින් ප්‍රතිපත්ති අඛණ්ඩතාව සහතික කෙරෙන අතර වැඩසටහන ක්‍රියාත්මක කිරීම ශක්තිමත්ව පවතී. වැඩසටහන තුළින් අත්කරගත් දුෂ්කර ජයග්‍රහණයන් ආරක්ෂා කර ගැනීමට සහ දිගු කාලීන සාර්ව ආර්ථික ස්ථාවරත්වයක් හා ඉහළ

අන්තර්ගතභාවයකින් යුත් වර්ධනයක් කරා යන මාවතකට ආර්ථිකය ගෙන ඒම සඳහා ඉදිරි කාලයේ දී ප්‍රතිසංස්කරණවල ගම්‍යතාව පවත්වා ගැනීම ඉතා වැදගත් වේ.

"ගෝලීය අවිනිශ්චිතතාවය වැඩි වී ඇති පසුබිමක, සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය ආරක්ෂා කර ගැනීම සඳහා තිරසාර ආදායම් රැස් කිරීමේ ප්‍රයත්නයන් සහ 2025 වසරේ අයවැයට අනුකූලව විචක්ෂණශීලී අයවැය හැසිරවීම ඉතා වැදගත් වේ. කාර්යක්ෂම හා නිසි කලට ක්‍රියාත්මක වන එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ යාන්ත්‍රණයක් නැවත ස්ථාපිත කිරීම ඇතුළුව බදු අනුකූලතාව ඉහළ නැංවීම, අතිරේක බදු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට යොමු නොවී ආදායම් වැඩි කිරීම සඳහා දායක වීමට උපකාරී වනු ඇත. නව බදු නිදහස් කිරීම්වලින් වැළකී සිටීම, රාජ්‍ය මූල්‍ය ආදායම් කාන්දුවීම් හා දූෂණ අවදානම් අවම කිරීමට සහ ශ්‍රී ලංකාවේ වඩාත්ම අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ට සහාය වීම සඳහා සමාජ වියදම් ඇතුළුව අත්‍යවශ්‍ය රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක ගොඩ නැංවීමට උපකාරී වනු ඇත. පිරිවැය ආවරණය වන විදුලිය මිලකරණය යථා තත්ත්වයට පත් කිරීම, විදුලිබල රාජ්‍ය ව්‍යවසායයෙන් පැන නගින රාජ්‍ය මූල්‍ය අවදානම් අවම කිරීමට උපකාරී වේ.

"මෙම අවිනිශ්චිත අවස්ථාවේ දී දිළිඳු සහ අවදානමට ලක්විය හැකි අය ආරක්ෂා කර ගැනීම සඳහා රජයට වැදගත් වගකීමක් ඇත. සමාජ ආරක්ෂණ ජාල ඉලක්ක කිරීම මෙන්ම ඒවායෙහි ප්‍රමාණවත් බව සහ ආවරණය වැඩි දියුණු කිරීම සඳහා දරන උත්සාහයන් දෙගුණ කිරීම වැදගත් වේ. රාජ්‍ය මූල්‍ය සහාය හොඳින් ඉලක්ක විය යුතු අතර, නිසි කාලයක් තුළ සහ පවතින අයවැය රාමුව තුළ ක්‍රියාත්මක විය යුතුය.

"උද්ධමනය අඩු මට්ටමක පවතින අතර, තිරසාර මිල ස්ථායීතාව සහතික කිරීම සහ සාර්ව ආර්ථික ස්ථායීතාවට සහාය වීම සඳහා අඛණ්ඩ අධීක්ෂණය අවශ්‍ය වේ. ගෝලීය අවිනිශ්චිතතා පවතින පසුබිමක, සංචිත ඉහළ නැංවීම තුළින් බාහිර ස්වාරක්ෂක අඛණ්ඩව නැවත ගොඩ නංවා ගැනීම වැදගත් වේ.

"සාකච්ඡා අඛණ්ඩව සිදුවෙමින් පවතින අතර, පිරිවැය ආවරණය වන විදුලිය මිලකරණය යථා තත්ත්වයට පත් කිරීම, බදු නිදහස් කිරීමේ රාමුව ශක්තිමත් කිරීම සහ අනෙකුත් වැදගත් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් ප්‍රගතියක් ලබා ගැනීමට බලධාරීන් දිරිමත් කරනු ලැබේ.

"අතිගරු ජනාධිපති සහ මුදල් අමාත්‍ය අනුර කුමාර දිසානායක මහතා, ගරු අග්‍රාමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය මෙනවිය, ගරු කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය මහාචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතා, ගරු මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා, භාණ්ඩාගාර ලේකම් කේ.එම්. මහින්ද සිරිවර්ධන මහතා, ජනාධිපති ජ්‍යෙෂ්ඨ ආර්ථික උපදේශක දුමින්ද හුලංගමුව මහතා ඇතුළු රජයේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ ජා.මූ. අරමුදලේ කණ්ඩායම සාකච්ඡා පැවැත්වීය. තවද ජා.මූ. අරමුදලේ කණ්ඩායම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පෞද්ගලික අංශයේ නියෝජිතයින්, සිවිල් සමාජ සංවිධාන සහ සංවර්ධන හවුල්කරුවන් ද හමුවිය.

"දූත මෙහෙය අතරතුර ලබාදුන් විශිෂ්ට සහයෝගය වෙනුවෙන් බලධාරීන්ට ස්තුති කිරීමට අපි කැමැත්තෙමු. නුදුරු කාලයේ දී කාර්ය මණ්ඩල මට්ටමේ එකඟතාවයකට එළැඹීමේ අරමුණින් සිව්වන සමාලෝචනය නියමිත කාලයේ දී අවසන් කිරීමට ඉඩකඩ සැලසීම සඳහා සාකච්ඡා අඛණ්ඩව පවත්වාගෙන යෑම අවශ්‍ය වේ. මෙම අවිනිශ්චිත කාලපරිච්ඡේදයේ දී ශ්‍රී ලංකාවට සහාය දැක්වීමට අපගේ කැපවීම අපි යළිත් තහවුරු කරමු."